# 2025 ජූලි මස මාසික සභා රැස්වීම් වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව
දිනය - 2025.07.22
වේලාව - පෙ.ව. 10.00

පැමිණීම

| | නම | තනතුර |
|---|---|---|
| I. | එච්.එල්.ජයසිරි | - ගරු සභාපති |
| II. | ආර්.රජිත් ප්‍රියදර්ශන | - ගරු උපසභාපති |
| III. | හර්ෂ උදයකුමාර ජයවීර | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IV. | ආර්.කේ.එම්.රෝහිත | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| V. | එම්.එල්.එම්.හනීෆා | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VI. | කේ.රත්න | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VII. | එම්.ඒ.ආරියසේන | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VIII. | එන්.ටී.චමින්ද ජයනාත් | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IX. | පී.එම්.අතුර ප්‍රියන්ත | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| X. | එම්.එල්.එම්.අසාර් | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XI. | බී.කේ.නිලුකා කුමුදුනි | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XII. | ආර්.ඩබ්ලිව්.සිරිසේන | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIII. | කේ.පී.තමිලා දිල්රුක්ෂි | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIV. | සුදත් චමින්ද උයනහේවා | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XV. | බී.නිපුන ගයාශාන් | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVI. | එස්.දයාසේන | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVII. | එල්.වයි.නුවන් චතුරංග | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVIII. | ජේ.ඒ.තනුජා දිලානි | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIX. | උදානි ලියනගේ | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XX. | එල්.ඒ.සුනිල් පියංකර | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXI. | ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණී | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXII. | එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම :- ---

ප්‍රථමයෙන්ම සියලුම දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව,ගරු සභාපති , එච්.එල්.ජයසිරි මහතා විසින් 2025 වර්ෂයේ ජූලි මස මාසික සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය හා මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි

මහතාත් , රුක්මන් රත්නායක මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

(අ) 2025.06.13 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

2025.06.13 වන දින පවත්වන ලද මහ සභා වාර්තාවේ " පංචසීලය සමාදන් වීමෙන් " ලෙස සඳහන් කරන ලද වාක්‍ය ඛණ්ඩය " ආගම සිහිකිරීමෙන් " ලෙස සංශෝධනය කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජ්.ආරියසේන මහතා විසින් දන්වා සිටින ලදී.

ඒ අනුව 2025.06.13 දිනැති මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු එච්.එල්.ජයසිරි මහතා යෝජනා කරන ලදී. 2025.06.13 දිනැති මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා යෝජනා කළ අතර , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තම්ලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන. - නැත
(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.-නැත
(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න. - නැත
(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

➢ <u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**01.** <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂය සඳහා විගණන ගාස්තු ගෙවීම සඳහා වූ යෝජනාව</u>

2018 අංක 19 දරණ විගණන පනතේ 18 වගන්තිය යටතේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂය සඳහා විගණන ගාස්තු ලෙස ගෙවිය යුතු රුපියල් දෙලක්ෂ විසි එක් දහස් තුන්සිය විස්සයි ශත අසූවක (221,320.80) මුදල , විගණකාධිපති ,විගණන කාර්යාලය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LL-7379 ගලි බවුසර රථයට අලුත්වැඩියා කටයුතු සිදු කිරීමටත්, අදාල බිල්පත් පියවීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරයේ ගලි පොම්පය මේ වන විට අලුත්වැඩියා කළ නොහැකි තත්වයක පවතින අතර නව ගලි පොම්පයක් සවි කිරීමට සිදු වී ඇත.ඒ අනුව දකුණු පළාත් පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ උපදෙස් පරිදි රථය සඳහා නව ගලි පොම්පයක් සවි කිරීමට රථය solex ආයතනය වෙත යොමු කළ අතර, ගලි ටැංකිය ද දිරාම සහිතව දැඩි ලෙස අබලන්ව පවතින බැවින් නව ගලි පොම්පයක් සවි කිරීම සඳහා ඊට උචිත මට්ටමේ නව ගලි ටැංකියක් ද සවි කිරීමට සිදු විය හැකි බැවින් එම සම්පූර්ණ අලුත්වැඩියාව

සිදු කිරීම සඳහා එම ආයතනය විසින් ඉදිරිපත්කර ඇති රු. 4,490,000.00 (ගලි බවුසර් ටැංකිය සඳහා) හා රු. 1,123,356.00 (ගලි පොම්පය සඳහා) වන ඇස්තමේන්තුවත්, තව ද ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ප්‍රාදේශීය වාරිමාර්ග යාන්ත්‍රික ඉංජිනේරු එම්. මහේෂ් උදයංග මහතා ප්‍රාදේශීය සභා පරිශ්‍රයට කැඳවා මෙම රථය පරීක්ෂාවට ලක් කළ අතර එතුමාගේ නිර්දේශ අනුව ගලි බවුසරය සඳහා නව ගලි පොම්පයක් සපයා සවිකිරීම සඳහා ප්‍රාදේශීය ගරාජයක් වන තිළිණ මෝටර්ස් ආයතනය වෙත ඉදිරිපත් කළ අතර, එමගින් ලබාගන්නා ලද රු. 694,200.00 ක් වන ඇස්තමේන්තුවත් 2025.06.19 දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව ප්‍රාදේශීය ගරාජයක් වන තිළිණ මෝටර්ස් ආයතනය වෙතින් ඉදිරිපත් කරන ලද රු. 694,200.00 ක් වන ඇස්තමේන්තුව සඳහා දකුණු පළාත් පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ අනුමැතිය හා 2025.06.19 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි වූ අතර ඒ අනුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීමටත්, අදාල බිල්පත් පියවීමටත් 2025.07.04 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ ලබා දුන් අතර එම ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. <u>තොග ඉන්ධන බවුසරයක් නිර්මාණය කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු රථවාහන සහ යන්ත්‍ර සූත්‍ර සඳහා ඉන්ධන ලබාදීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි තොග ඉන්ධන බවුසරයක් නිර්මාණය කිරීම සඳහා දැනට සභාව සතු සුදු යකඩ ට්‍රැක්ටර් ජල බවුසරයට සුදුසු ආකාරයේ ඉන්ධන මීටරයක් සපයා සවිකිරීමට අදාළව විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට 2025.06.19 දිනැති මුදල් කමිටුවේ නිර්දේශ ලබාදෙන ලදී. ඒ අනුව තාක්ෂණ සේවා නිළධාරි විසින් ලබා දෙන ලද පිරිවිතරයන් අනුව මිලගණන් කැඳවන ලද අතර, ප්‍රියන්ත එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් ලබා දෙන ලද 311,500.00 වන ඇස්තමේන්තුවට අදාලව මිලදී ගැනීම කටයුතු සිදු කිරීම සඳහා 2025.06.30 දින පැවති ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදි. තව ද එම යොජනාව සඳහා 2025.07.04 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි වූ අතර ඒ අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. <u>ටොන් 10 - 8 රෝල ප්‍රවාහනය කිරීම සඳහා තට්ටුවක් සකස් කර ගැනීම සඳහා වූ යෝජනා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායිව ඉටුකිරීම සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතුව මාර්ග සංවර්ධන කටයුතු සඳහා යොදා ගනු ලබන ටොන් 8 - 10 (අට දහය) ප්‍රමාණයේ තලන රෝලක් (vibrating roller) පවතින නමුත් මෙම යන්ත්‍රය ප්‍රවාහනය කිරීම සඳහා සුදුසු තට්ටුවක් සභාව සතුව නොමැත. එබැවින් ප්‍රාදේශීය වාරිමාර්ග යාන්ත්‍රික ඉංජිනේරු එම්.මහේෂ් උදයංග මහතාගේ නිර්දේශ අනුව

පිටතින් අවශ්‍ය ද්‍රව්‍ය මිලදීගෙන ප්‍රාදේශීය සභා යාන්ත්‍රික ඒකකය මගින් සුදුසු තටටුවක් සකස් කිරීම සඳහා වන යොජනාවට 2025.07.04 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි වූ අතර, ඒ අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ධාවනයෙන් ඉවත් කරන ලද මහ ට්‍රැක්ටර් ටේලර් 03 ක් අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ධාවනයෙන් ඉවත් කරන ලද මහ ට්‍රැක්ටර් ටේලර් 03 ක් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පරිපාලකතුමා විසින් සිදුකරන ලද ඉල්ලීමට ගරු සභාපතිතුමාගේ අනුමැතිය හිමිවී ඇති අතර, අදාළ ටේලර් 03 අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රාදේශීය වාරිමාර්ග යාන්ත්‍රික ඉංජිනේරු එම්.මහේෂ් උදයංග මහතා වෙත යොමු කළ අතර එතුමාගේ නිර්දේශ අනුව ඇස්තමේන්තු ලබාගෙන අදාළ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා විෂය නිලධාරි විසින් කරන ලද යෝජනාවට 2025.06.19 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි වූ අතර, ඒ අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේවා මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LE-7462 අංක දරණ බොලෙරෝ කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LE-7462 අංක දරණ බොලෙරෝ කැබ් රථය දීර්ඝ කාලයක සිට අලුත්වැඩියාව සඳහා නතර කර ඇති අතර එම රථය ප්‍රාදේශීය වාරිමාර්ග යාන්ත්‍රික ඉංජිනේරු එම්. මහේෂ් උදයංග මහතා ආයතනය වෙත කැඳවා පරීක්ෂාවට ලක් කළ අතර එතුමාගේ නිර්දේශ අනුව රථයේ එන්ජිම අලුත්වැඩියා කිරීමටත් ඉදිරිපස වීදුරුව අලුත්වැඩියා කිරීමටත් අනුමැතිය හිමි වූ අතර එම නිර්දේශ අනුව ඉදිරි අලුත්වැඩියා කිරීම කටයුතු සිදුකිරීම සඳහා විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට 2025.06.19 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි වූ අතර, ඒ අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LA-1442 අංක දරණ ටිපර් රථය අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LA-1442 අංක දරණ ටිපර් රථය දීර්ඝ කාලයක සිට අලුත්වැඩියා කටයුතු සඳහා නතර කර ඇති අතර යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ සහිතව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට 2025.06.19 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි වූ අතර, ඒ අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 08. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LA-1440 අංක දරණ ටිපර් රථයේ එන්ජිම අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LA-1440 අංක දරණ ටිපර් රථයේ එන්ජිම අලුත්වැඩියා කිරීමට සිදුවී ඇති අතර එම රථයේ එන්ජිම අලුත්වැඩියා කිරීමට ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු මහේෂ් උදයංග මහතා වෙත යොමු කළ අතර එතුමාගේ නිර්දේශ අනුව රථයේ ෆුල් ඕවරෝල් එන්ජින් රෙපයාර් එකක් සිදු කිරීමටත් , එන්ජෙක්ටර් පම්ප් සර්විස් කිරීමටත් නිර්දේශ හිමි වූ අතර, ඒ අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට 2025.06.19 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි වූ අතර, ඒ අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලූකා කුමුදුනි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 09. <u>වැය ශීර්ෂ මාරු කිරීම සඳහා වූ යෝජනාව</u>

2025 අයවැය ලේඛනයේ 03 වන වැඩසටහනේ 309-7-3 වැය ශීර්ෂ අංකයටතේ සඳහන් වන රථවාහන නැවතුම්පොළ අළුත්වැඩියාව යටතේ වන රු.2,000,000.00 ක මුදලින් රු.1,500,000.00 ක මුදල 06 වැඩසටහනේ 609-7-1 වැය ශීර්ෂ අංක යටතේ සඳහන් වන පෙර පාසල්, ආයුර්වේද හා පුස්තකාල සංවර්ධනය සඳහා වැය ශීර්ෂගත කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 10. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් මහසෙන්පුර ආදාහනාගාරයට ලබාගන්නා ලද ගෑස් සිලින්ඩරයන්හි බර කිරීමේ කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික් තරාදියක් ලබා ගැනීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් මහසෙන්පුර ආදාහනාගාරයට ලබාගන්නා ලද ගෑස් සිලින්ඩරයන්හි බර කිරීමේ කටයුතු සඳහා 100kg ක් හෝ ඊට වඩා බරක් දැරීමේ හැකියාව ඇති ඉලෙක්ට්‍රොනික් තරාදියක් (150kg - 600mm x 600mm Electronic Platform Scale with Steel Platform ) ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කාර්යයන් සඳහා දරන ලද රු.100,000.00 වැඩි වැය කිරීම සඳහා ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව

2025-06-19 හා 2025-07-04 දිනයන්හි පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශය හිමි ව ඇති, ප්‍රාදේශීය සභාවේ කාර්යයන් සඳහා දරන ලද රු.100,000.00 වැඩි වැය කිරීම සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ , පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබාදීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උපලේඛන

| අනු අංකය | ගෙවන ලද/ගෙවීමට ඇති ආයතනය | විස්තරය | බිල්පත් අංකය හා දිනය | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| i. | ඊ.ඒ. ලැබ් මැනුෆැක්චරින් ප්‍රයිවට් ලිමිටඩ් | ඇඟිලි සලකුණු යන්ත්‍රය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | M 10530 / 2025.06.23 | 100,800.00 |
| ii. | ලේකම් | මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීම සඳහා පිටතින් සේවය ලබාගත් පුද්ගලයින් තිදෙනා වෙත ගෙවීම | - | 106,000.00 |
| iii. | වයර්ලින්ක් (පුද්.) සමාගම | Lm-5616 කම්පැක්ටර් රථය සඳහා 825*16 ටයර් 02, ටියුබ් 02, රිම්ටේප් 02 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 003810 | 127,664.00 |
| iv. | වයර්ලින්ක් (පුද්.) සමාගම | 56-1099 කැබ්රථය සඳහා 215*75 *15 ටයර් 04 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 003809 | 129,536.00 |
| v. | ජේ.එම්. ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් සප්ලයර්ස් | JS-9860 බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 1453 | 458,000.00 |
| vi. | කුසුම් මෝටර්ස් | RD-8051 මහ ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 6329 | 108,455.00 |
| vii. | සුදත් මෝටර්ස් | RD-8051 මහ ට්‍රැක්ටරය එන්ජිම අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 94 / 6330 / 2403 / 3338 | 112,300.00 |
| viii. | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | වීදි පහන් සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 2233 | 739,700.00 |
| ix. | නිව් සමනල ෆර්නිචර්ස් | කුෂන් පුටු 12 ක් සහ කැරකෙන කාර්යාලීය පුටුවක් මිලදී ගැනීම | 001973 | 117,900.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙනුවෙන් ගෙවීම | | |
| x. | ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාව | LL-6981 ටිපර් රථය සඳහා 1000*20 ටයර් 02, ටියුබ් 02, රිම්ටේප් 02 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 2229658 | 172,516.00 |
| xi. | ඉරේෂා ඉන්ධන පිරවුම්හල | ඉන්ධන සඳහා ගෙවීම | 394 | 3,705,176.00 |
| xii. | සෝමසිරි ස්ටෝර්ස් | ආදාහනාගාරය සඳහා ගෑස් මිලදී ගැනීම | MIV33198 / 2025.06.07 | 124,690.98 |
| xiii. | ඉරේෂා ඉන්ධන පිරවුම්හල | ඉන්ධන සඳහා ගෙවීම | 4959 - 2025.06.10<br><br>4969/4970 - 2025.06.16 | 822,550.50 |
| xiv. | සෝමසිරි ස්ටෝර්ස් | ආදාහනාගාරය සඳහා ගෑස් මිලදී ගැනීම | MIV38658 / 2025.07.09 | 142503.97 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

➢ <u>කාර්මික සේවා කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

12.(i) <u>දකුණු පළාත් සංවර්ධන සැලැස්ම- 2025 වැඩසටහන යටතේ ප්‍රතිපාදන හිමි වී ඇති ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනාව</u>

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම- 2025 වැඩසටහන යටතේ ප්‍රතිපාදන හිමි වී ඇති ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | අංශය | අනුමත ව්‍යාපෘතිය | ප්‍රතිපාදන මුදල (මිලියන) | සංශෝධන |
|---|---|---|---|---|
| i. | වෙනත් සේවා | යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීම | 2.00 | සංශෝධනය වී ඇත. |
| ii. | වෙනත් සේවා | උද්ධකන්දර පෙර පසලේ සිවිලිම සකස් කිරීම | 0.50 | ගණේයාය පෙර පාසලේ වහලය සහ සිවිලිම සකස් කිරීම |
| iii. | වෙනත් සේවා | උද්ධකන්දර පෙර පසලේ සිවිලිම සකස් කිරීම | 2.00 | උද්ධකන්දර පෙර පසලේ සිවිලිම සකස් කිරීම සහ දෙවන ශාලාවෙහි ජනෙල් කවුලු ආවරණ සකස් කිරීම |
| iv. | වෙනත් සේවා | තිස්ස පූජා භූමියේ සංචාරකයින් සඳහා විවේක ගන්නා ස්ථානයක් සකස් | 2.00 | නැත |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීම | | |
| v. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 3.00 | සංශෝධනය වී ඇත. |
| vi. | මාර්ග | මෝලකැප්පතාන පාසල පිටුපස කාපට් එක දක්වා මාර්ගය කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම | 2.00 | මෝලකැප්පතාන පාසල පිටුපස කාපට් එක දක්වා මාර්ගය සහ ජයමාවතේ අතුරු මාර්ගය වන ජී.කේ.කේ.සුධර්මා මහත්මියගේ නිවස අසල සිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම. |
| vii. | මාර්ග | පන්නගමුව රාජපක්ෂ මාවතේ සිට ඇලකණ්ඩිය දක්වා මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම | 2.00 | පන්නගමුව රාජපක්ෂ මාවතේ සිට ඇලකණ්ඩිය දක්වා මාර්ගයේ ඉතිරි කොටස සහ පන්නගමුව ඇලකණ්ඩිය පාරේ පතිනායක කුමාර මහතාගේ නිවස අසල සිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම. |
| viii. | මාර්ග | තිස්ස නගරයේ කාණු පද්ධතිය දීර්ඝ කිරීම. (වැසිජලය බැස්සවීම සහ ගංවතුර පාලනය කිරීම) | 3.00 | සංශෝධනය වී ඇත. |
| ix. | ප්‍රජා ජල | අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ජල සැපයුම සකස් කිරීම | 0.50 | නැත |
| x. | ප්‍රජා ජල | දෙබරවැව ක්‍රීඩා පිටියේ විවේකාගාරයට ජලය සැපයීම. | 1.00 | නැත |
| xi. | ප්‍රජා ජල | දෙබරවැව ක්‍රීඩා පිටියේ විවේකාගාරයට ජලය සැපයීම | 1.00 | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා ජලය සැපයීම |
| xii. | | | | කාවන්තිස්සපුර පෙර පාසල සඳහා ජලය සැපයීම |
| xiii. | ප්‍රජා ජල | නැදිගම්විල නවෝදා ප්‍රජා ජල ව්‍යාපෘතියට අදාළව කිරිඳිඔයේ ළිඳක් සකස් කර ජලය පොම්ප කර බෙදා හැරීම. ( ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තු සමඟ ) | 5.00 | සංශෝධනය වී ඇත. |
| xiv. | වෙනත් / | ඉක්කපල්ලම පාසලේ | 1.50 | නැත |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ග | ප්‍රධාන ගේට්ටුව ඉදිරිපට ප්‍රධාන බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම | | |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12.(ii) <u>දකුණ පළාත් ,සංවර්ධන සැලැස්ම- 2025 වැඩසටහන යටතේ අනුමත වී ඇති ඉහත ව්‍යාපෘති ,ඉදිරියට කරගෙන යාම සඳහා වූ යෝජනාව</u>

දකුණ පළාත් ,සංවර්ධන සැලැස්ම- 2025 වැඩසටහන යටතේ අනුමත වී ඇති ඉහත දක්වා ඇති ව්‍යාපෘති අතුරින් මිලියන 02 ට අඩු ව්‍යාපෘති සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීම මත බල ප්‍රදේශයේ ප්‍රජාපාදක සංවිධානයක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනැම්මටත්, මිලියන 02 ට වැඩි ව්‍යාපෘති සඳහා සීමිත ප්‍රසම්පාදන දැන්වීමක් හෝ පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි ආයතනයක් වෙත පිරිනැමීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. <u>බහුකාර්ය ගොඩනැගිල්ලේ වහලයේ ඉතිරි කොටස සකස් කිරීම සහ කාණු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ලේඛා කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත පිරිනැමීම සඳහා වූ යෝජනාව</u>

බහුකාර්ය ගොඩනැගිල්ලේ වහලයේ ඉතිරි කොටස සකස් කිරීම සහ කාණු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇති අතර එම කමිටුවේ නිර්දේශය පරිදි ලේඛා කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| බහුකාර්ය ගොඩනැගිල්ලේ වහලය සකස් කිරීම | - රු. 17,151,449.99 |
| කාණු පද්ධතිය සකස් කිරීම | - රු. 3,829,950.58 |

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

බහුකාර්ය ගොඩනැගිල්ලේ වහලයේ ඉතිරි කොටස සකස් කිරීම සහ කාණු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණ ද එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සැලසුම සම්බන්ධයෙන් යම් යම් ගැටලුකාරී තත්වයක් පවතින බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ , සභාපතිතුමා සමඟ සාකච්ඡාවක් සිදු කර අවසන් තීරණය ලබාගන්නා තුරු මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම තාවකාලිකව නතර කිරීම සුදුසු බවට අදහස් දක්වන ලදී.

ඉහත කරුණු හේතුවෙන් සභා සම්මත නොවිය.

14. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු නිල නිවාසය නඩත්තු කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු නිල නිවාසය අබලන් වී ඇති බැවින් එම ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සිදු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අයත් මහසෙන්පුර ආදාහනාගාරයේ තීන්ත ආලේපනය කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අයත් මහසෙන්පුර ආදාහනාගාරයේ තීන්ත ආලේපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් වාහන සේදුම් මධ්‍යස්ථානය සහ වාහන නැවතුම් අංගනයක් ඉදිකිරීම සඳහා වූ යෝජනාව.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් වාහන සේදුම් මධ්‍යස්ථානය සහ වාහන නැවතුම් අංගනයක් ඉදිකිරීමේ අවශ්‍යතාවය පවතින බැවින් ඒ සඳහා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. තිස්සමහාරාම ආයුර්වේද මධ්‍යස්ථාන භූමියේ කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ යෝජනාව.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් , තිස්සමහාරාම ආයුර්වේද මධ්‍යස්ථාන භූමියේ කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

➢ <u>පරිසර පොදු පහසුකම් කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

18. <u>කතරගම මහ දේවාලය මූලික කොටගෙන වාර්ෂිකව පැවැත්වෙන ඇසල පෙරහැර හා පූජෝත්සවය සඳහා තාවකාලික කම්කරුවන් සේවයේ යොදවා ගැනීම සඳහා වූ යෝජනාව.</u>

කතරගම මහ දේවාලය මූලික කොටගෙන වාර්ෂිකව පැවැත්වෙන ඇසල පෙරහැර හා පූජෝත්සවය සඳහා 2025.07.09/10/11 යන දින සඳහා එක් දිනකට තාවකාලික කම්කරුවන් 04 බැගින් දින 03ට සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

19. <u>කසල දැමීම තහනම් යනුවෙන් දැන්වීම් පුවරු සවි කිරීම සඳහා වූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැන නැගී ඇති කසල ගැටළුව සම්බන්ධයෙන් පහත සඳහන් ස්ථාන වල කසල දැමීම තහනම් යනුවෙන් දැන්වීම් පුවරු සවි කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- තිස්සමහාරාම ලෝරි රථ ගාල
- තිස්සමහාරාම පොදු වෙළඳපොළ අංක 113 සහ 114 කඩ කාමර අසල
- තිස්ස වැව අසල
- යෝධකණ්ඩිය වැව අසල
- දෙබරවැව පොදු වෙළඳපොල
- නිව් ලසන් ට්‍රේඩ් සෙන්ටර් අසල

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>අදහස් දැක්වීම</u> - <u>ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශියේ අක්‍රමවත් ලෙස කසල බැහර කිරීම සිදු වන බැවින් එය හැකි ඉක්මනින් ක්‍රමවත් කර ගැනීමට සඳහා කොට්ඨාස වශයෙන් ජනතාව දැනුවත් කිරීමට සියළුම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සහය අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

යාල හන්දියේ පවත්වන ලද පෙරහැර හේතුවෙන් එහි මේ වන විට කසල රැස් වී ඇති බැවින් එය ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

20. ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා වූ යෝජනාව

ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමටත් ,ඒසඳහා පහත සඳහන් ස්ථාන සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

- තිස්සමහාරාම ලොරි රථ ගාල
- තිස්සමහාරාම පොදු වෙළඳපොල
- දෙබරවැව පොළ

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා

ඉහත දක්වන ලද ස්ථාන වලට අමතරව මහසෙන්පුර ආදාහනාගාරයේ ද ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

21. තිස්සමහාරාම සඳුන්ගම මාර්ගය අවට ප්‍රදේශය සංචාරක උද්‍යානයක් ලෙස නවීකරණය කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම සඳුන්ගම මාර්ගය අසල, මාර ගස්වල ගැවසෙන වවුලන් ගහනය අධික බැවින් එය නැරඹීම සඳහා විශාල සංචාරකයින් පිරිසක් පැමිණීම හේතුවෙන් එම ප්‍රදේශය සංචාරක උද්‍යානයක් ලෙස නවීකරණය කිරීමටත් සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. යෝධවැව වල දොර වැසිකිළිය නවීකරණය කිරීම සඳහා වූ යෝජනාව

යෝධවැව වල දොර වැසිකිළිය නවීකරණය කිරීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලූකා කුමුදුනි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා

යෝධවැව වල දොර වැසිකිළිය පාවිච්චි කිරීමට සුදුසු තත්වයේ නොපවතින බැවින් අලුතින් වැසිකිලියක් ඉදි කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

23. කිරින්ද සිට කිරිදිඹය මෝය දක්වා සංචාරකයින්ට නැරඹීම සඳහා සංචාරක කලාපයක් ලෙස නවීකරණය කිරීම සඳහා වූ යෝජනාව

කිරින්ද සිට කිරිදිඹය මෝය දක්වා සංචාරකයින්ට නැරඹීම සඳහා සංචාරක කලාපයක් ලෙස නවීකරණය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා</u>

බුත්දල ,කිරිදිගම්මෝය ,නිදන්ගලවැල්ල ,කිරින්ද යන ස්ථාන විශාල සංචාරක ආකර්ෂණයක් හිමිව ඇති ස්ථාන බැවින් මෙම ස්ථාන ද සංචාරක කලාප ලෙස සංවර්ධනය කළහොත් ආදායම් උපයාගත හැකි බව ප්‍රකාශ කර සිටින ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා</u>

අඳගලවැල්ල , වීරවිල වැව යන ප්‍රදේශයන් ද සංචාරක කලාප ලෙස සංවර්ධනය කළහොත් ආදායම් උපයාගත හැකි බව ප්‍රකාශ කර සිටින ලදි.

24. <u>තිස්සමහාරාම ප්‍රදේශය සඳහා පවතින කාණු පද්ධතිය විධිමත්ව සකස් කිරීමටත් ඒ සඳහා සුදුසු ආයතන සම්බන්ධ කර ගැනීමත් සඳහා වූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රදේශය සඳහා පවතින කාණු පද්ධතියේ ගැටළුකාරී තත්වයක් පවතින බැවින් විධිමත්ව කාණු පද්ධතිය සකස් කිරීමටත් ඒ සඳහා සුදුසු ආයතන සම්බන්ධ කර ගැනීමටත් , මෙම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමුකිරීමත් සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

➢ <u>නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

25. <u>ජාතික කියවීම් මාසය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් සහ ඒ සඳහා 2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වැය කිරීම සඳහා වූ යෝජනාව.</u>

ජාතික කියවීම් මාසය වැඩසටහන සැමරීම සඳහා මහජන පුස්තකාලය මුල් කර ගනිමින් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් , ඒ සඳහා සකස් කරන ලද දළ ඇස්තමේන්තුවට අනුව එහි මුළු වියදම වශයෙන් රු.776,200.00 මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර,2025 වර්ෂයේ අයවැය ලේඛනයේ 605-9(4) වැය ශීර්ෂ මගින් වෙන් කර ඇති රු.400,000.00 ක මුදලක් හා 605-9(7) වැය ශීර්ෂ මගින් වෙන් කර ඇති රු.100,000.00 ක මුදලක් දැරීමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවටත් , ඉතිරි මුදල වන රු.276,200.00 ක මුදල පරිත්‍යාගශීලින්ගෙන් ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

26. තිස්සමහාරාම සහා බල ප්‍රදේශයේ ගැබිනි මවුවරුන් සඳහා සංගීත චිකිත්සක වැඩසටහනක් හෝ දේශනයක් ඇතුළත් වැඩසටහනක් සිදු කිරිම සහ ඒ සඳහා 2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වැය කිරිම සඳහා වූ යෝජනාව.

තිස්සමහාරාම සහා බල ප්‍රදේශයේ ගැබිනි මවුවරුන් සඳහා සංගීත චිකිත්සක වැඩසටහනක් හෝ දේශනයක් ඇතුළත් වැඩසටහනක් සිදු කරන ලෙස ආණ්ඩුකාර ලේකම්තුමා විසින් දන්වා ඇත.එම වැඩසටහන සඳහා 2025 වර්ෂයේ අයවැය ලේඛනයේ 605-9(6) වැය ශිර්ෂ මගින් වෙන් කර ඇති රු 100,000.00 මුදලක් දැරිමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනිම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරිම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

27. ලෝක ළමා දින සැමරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමටත් ඒ සඳහා 2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වැය කිරිම සඳහා වූ යෝජනාව.

ලෝක ළමා දින සැමරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමටත් ඒ සඳහා 2025 වර්ෂයේ අයවැය ලේඛනයේ 605-9 (3) වැය ශිර්ෂ මගින් වෙන් කර ඇති රු.250,000.00 මුදලක් දැරිමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරිම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

28. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපලේ කාර්යන් සිදු කර ගැනිමට පැස්සුම්කරුවන් දෙදෙනෙකුගේ සේවය පිටතින් ලබා ගැනිමටත්, ඒ සඳහා දිස්ත්‍රික් මිල ගණන් යටතේ ගෙවීම් කිරිම සඳහා වූ යෝජනාව.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපලේ සේවයේ නියුතුව සිටි පැස්සුම්කරු වන එම්.සුරංග ප්‍රදීප් මහතා මේ වන විට රෝහල් ගත වී සිටින බැවින් යාන්ත්‍රික වැඩපලේ කාර්යන් සිදු කර ගැනිමට මාස 02 ක කාලයක් සඳහා පැස්සුම්කරුවන් දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීමටත්, ඒ සඳහා දිස්ත්‍රික් මිල ගණන් යටතේ දිනකට රු.4,100.00 ක මුදලක් ගෙවීමටත් සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

29. <u>පහත දක්වා ඇති ව්‍යාපෘතින්හි ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත පහත දක්වා ඇති ව්‍යාපෘතින්ට අදාළව සකස් කරන ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | අරමුදල් ප්‍රභවය | ඇස්තමේන්තු මුදල (රු) |
|---|---|---|---|
| I. | දෙබරවැව ක්‍රීඩාපිටියේ විවේකාගාරයට ජලය සැපයීම | පළාත් නිශ්චිත | 1,073,599.23 |
| II. | තිස්ස නගරයේ කාණු පද්ධතිය දීර්ඝ කිරීම . (වැසිජලය බැස්සවීම සහ ගංවතුර පාලනය කිරීම) | පළාත් නිශ්චිත | 2,836,981.89 |
| III. | ප්‍රදීපා මහත්මියගේ නිවස අසල වම් පස මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීම | සභා අරමුදල් | 58,815.28 |
| IV. | ප්‍රදීපා මහත්මියගේ නිවස අසල දකුණු පස මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීම | සභා අරමුදල් | 58,815.28 |
| V. | අකුරුගොඩ සුසානභූමියේ ඇන්වීම් පුවරුව සකස් කිරීම | සභා අරමුදල් | 36,245.00 |
| VI. | තිස්සමහාරාම පූජා භූමියේ සංචාරකයින් සඳහා විවේක ගන්නා ස්ථානයක් සකස් කිරීම | පළාත් නිශ්චිත | 2,656,054.44 |
| VII. | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | පළාත් නිශ්චිත | 3,141,851.42 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

30. <u>තිස්සමහාරාම පූජා භූමියේ සංචාරකයින් සඳහා විවේක ගන්නා ස්ථානයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා වූ යෝජනාව.</u>

තිස්සමහාරාම පූජා භූමියේ සංචාරකයින් සඳහා විවේක ගන්නා ස්ථානයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.2,656,054.44 ක් වන අතර දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රතිපාදන හිමිවන්නේ රු.මි. 2.00 ක් බැවින් ඉතිරි රු.656,054.44 ක මුදල සභා අරමුදලින් දරා මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

31. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු වටිනාකම

රු.3,141,851.42 ක් වන අතර දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රතිපාදන හිමිවන්නේ රු.මි. 3.00 ක් බැවින් ඉතිරි රු.141,851.42 ක මුදල සභා අරමුදලින් දරා මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

32. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ලේ රථ වාහන නැවතුම්පොළ භූමිය කාපට් අතුරා සංවර්ධනය කිරීම සහ බිම් මහලේ අනෙකුත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා වූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ලේ රථ වාහන නැවතුම්පොළ භූමිය කාපට් අතුරා සංවර්ධනය කිරීම සහ බිම් මහලේ අනෙකුත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) – 2025 යටතේ ඇස්තමේන්තු මුදල වන රු.10,000,000.00 ක මුදල අනුමත වී ඇති බැවින් එම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු පුවත්පත් දැන්වීමක් මගින් සිදුකිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ලේ රථ වාහන නැවතුම්පොළ භූමිය කාපට් අතුරා සංවර්ධනය කිරීම සඳහා මෙම වර්ෂයේ වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් ලබා දිය හැකි බවත්, ගොඩනැගිල්ලේ අනෙකුත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා මෙම වර්ෂයේ ප්‍රතිපාදන ලබාදීමට හැකියාවක් නොමැති බව පළාත් සභා සහ පළාත් පාලන ගරු නියෝජ්‍ය ඇමතිතුමා වන රුවන් සෙනරත් මහතා විසින් දැනුම් දී ඇති බව ප්‍රකාශ කරන ලදි.

33. <u>අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ ජල සැපයුම සකස් කිරීමේ ව්‍යාපෘතියේ නල ළිඳෙහි පොම්පය ගලවා නැවත සවි කිරීම හා නල ළිඳ පිරිසිදු කිරීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව</u>

අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ ජල සැපයුම සකස් කිරීමේ ව්‍යාපෘතියේ නල ළිඳෙහි පොම්පය ගලවා නැවත සවි කිරීම හා නල ළිඳ පිරිසිදු කිරීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රු.150,096.00ක මුදලක් ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

34. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පවතින සේවක ගැටළුව හා මුර සේවය මගින් අපේක්ෂා කරනු ලබන ප්‍රශස්ථ සේවය ලබා ගැනීම පිළිබඳව සලකා බලා පෞද්ගලික ආරක්ෂක අංශයේ සේවාව සපයනු ලබන ආයතනයක් මගින් ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවා ගැනීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින මුරකරු සංඛ්‍යාව 02 ක් වන අතර 2013.01.01 දින සිට ඉන් එක් තනතුරක් පුරප්පාඩුව පවතින අතර අනෙක් තනතුර සඳහා බඳවා ගන්නා ලද මුරකරුගේ සේවය ද මේ වන විට අත්හිටුවා ඇත.ඒ අනුව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය, ආදාහනාගාරය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, දෙබරවැව පොළ භූමිය හා කොම්පෝස්ට් මධ්‍යස්ථානය යන ස්ථාන 04 සඳහා ආරක්ෂාව වෙනුවෙන් වැඩ/ක්ෂේත්‍ර කම්කරුවකු හා සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙකු තාවකාලික මුරකරුවන් ලෙස පත්කර මුර සේවයේ යොදවා ඇත. එසේ සිදුකිරීම හේතුවෙන් මුරකරු තනතුර මගින් අපේක්ෂා කරනු ලබන සේවාව මැනවින් හා ක්‍රමවත්ව සිදු කර ගැනීම අපහසු වී ඇති අතර එසේ වෙනත් අංශයන්ගේ කම්කරුවන් මුර සේවය සඳහා යෙදවීම හේතුවෙන් එම අංශයන්හිද සේවකයන් හිඟතාවය හේතුවෙන් නොයෙක් ගැටළු උද්ගත වී ඇත.එබැවින් ආයතනයේ පවතින සේවක ගැටළුව හා මුර සේවය මගින් අපේක්ෂා කරනු ලබන ප්‍රශස්ථ සේවය ලබා ගැනීම පිළිබඳව සලකා බලා පෞද්ගලික ආරක්ෂක අංශයේ සේවාව සපයනු ලබන ආයතනයක් මගින් ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු පැය 24 සේවා මුර ක්‍රමයට යොදවා ගැනීමට අපේක්ෂා කරන අතර එම සේවාව මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා</u>

පෞද්ගලික ආරක්ෂක අංශයේ සේවාව සපයනු ලබන ආයතනයක් මගින් ආරක්ෂක නිලධාරීන් සිව් දෙනෙකු පැය 24 සේවා මුර ක්‍රමයට යොදවා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

35. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නා වූ ලේකම්වරයාට කාර්යාලය හා නිවාස ආසන්න ස්ථාන අතර ගමන් කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වූ යෝජනාව</u>

දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ/CLG/01/2020 අංක හා 2020.10.24 දිනැති ලිපිය මගින් දන්නවා ඇති පරිදි ප්‍රාදේශීය සභාවක බලතල හා කාර්යයන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නා වූ ලේකම්වරයාට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ (1) 19 (XXXII) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 132 (ච) වගන්තිය ප්‍රකාරව අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීමට හැකියාව ඇත.ඒ අනුව සභාවේ පවතින වාහන සංඛ්‍යාව හා ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාව මත විධිමත් සභා තීරණයකට යටත්ව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ9/22(XXXII) පරිදි කාර්යාලය හා නිවාස ආසන්න ස්ථාන අතර ගමන් කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

36. <u>පළාත් පාලන ආයතන සතු වාහන පළාත් පාලන ආයතන ප්‍රධානීන් (නගරාධිපති /සභාපති) නිල වාහන ලෙස භාවිත කිරීම සඳහා වූ යෝජනාව</u>

පළාත් පාලන ආයතන සතු වාහන පළාත් පාලන ආයතන ප්‍රධානීන්(නගරාධිපති /සභාපති) නිල වාහන ලෙස භාවිත කිරීම පිළිබඳ දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ 10/04/4 හා 2020.09.22 දිනැති ලිපිය අනුව හා දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ දපස 2014.10.21 හා 1/1/7ආ/අමාප්‍ර/දිනැති ලිපියේ උපදෙස් පරිදි සභාව සතු PF – 7365 අංක දරණ කැබ් රථය වෙන් කර දීමටත් ,පහත දක්වා ඇති එකඟතාවන්ට යටත්ව ඒ සඳහා මසකට නිකුත් කරන උපරිම ඉන්ධන ලීටර් ප්‍රමාණය සභාව මගින් තීරණය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

I. පළාත් පාලන ආයතනයේ සභාපතිතුමන්ගේ නිල කාර්යයන් සඳහා වෙන්කළ වාහනයක් ස්වකීය පෞද්ගලික කාර්යයන් සඳහා යොදවා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා සභාපතිවරුන් සෑම ලිත් මාසයක් සඳහාම ඒ සම්බන්ධයෙන් රුපියල් 300.00 ක මුදලක් පළාත් පාලන ආයතන අරමුදලට ගෙවීම කළ යුතුය.

II. සභාපතිවරයා සඳහා වෙන් කරන ලද නිල වාහනයට රියදුරකු යොදවා ගැනීමට අපහසු හදිසි අවස්ථාවකදී සභාපතිවරයා විසින්ම එකී නිල රථය ධාවනය කිරීම සිදුකළ හැකිය. ඒ සඳහා සභාපතිවරයාට වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.

III. නිල වාහනය රාජකාරී සඳහා යොදවා නොගන්නා අවස්ථාවලදී සභා පරිශ්‍රයේ හෝ සභාපතිවරයා භාරයේ වෙනත් සුදුසු ස්ථානයක ගාල්කර තැබීම සිදුකළ හැකිය.

IV. ඉහත අංක එක හා දෙක පරිදි සභාපතිවරයා කටයුතු කිරීමේදී අනතුරක් සිදුවුවහොත් එහි වගකීම සභාපතිවරයා සතුවේ.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

ගරු සභාපතිතුමා විසින් සිය නිල රථය, සභාපතිතුමාගේ සහ සභාවේ නිලධාරීන්ගේ විවිධ රාජකාරී කටයුතු සඳහා පමණක් යොදාගන්නා බැවින් මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණයේ සීමාවක් තිබීම අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

37. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යවස්ථානුකූලව කටයුතු කිරීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීට හා කොට්ඨාස මට්ටමින් කටයුතු කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත බලය පැවරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යවස්ථානුකූලව කටයුතු කිරීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීට හා කොට්ඨාස මට්ටමින් කටයුතු කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත බලය පැවරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

➢ <u>ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

38. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් 07 ක් පවතින අතර එයින් 06 ක්ම පෙර පාසල නම් කර ඇත්තේ ගමෙහි නම එකතු කර සිහින් අසපුව නමින් වන අතර ජුල්පල්ලම පෙර පාසලේ පමණක් පුද්ගල නාමයකින් හඳුන්වා දීම නොගැලපෙන බැවින් ජුල්පල්ලම පෙර පාසලේ නම "ජුල්පල්ලම සිහිනි අසපුව"ලෙසින් නම්කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

පෞද්ගලික ඉඩමක කොටසක් ලබා දීම හේතුවෙන් මෙම නම් කිරීම සිදු කර ඇති බව ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

ප්‍රාදේශීය ලේකම් සතු ඉඩමක් වීම හේතුවෙන් මෙම නම් කිරීම සුදුසු බවටත්, අදාල නම් කිරීම සිදු කරන ලද පුද්ගලයාට නිසි ගෞරවය ලබාදීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා</u>

පෞද්ගලිකව නම් යෙදීම සුදුසු නොවන බැවින් මෙම නම් කිරීම සුදුසු වන බවට ප්‍රකාශ කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

39. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අයත් බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය එළදායි සැලසුමකින් සහ නිසි ප්‍රමිතියකින් තොරව ඉදිකර ඇති බව නිරීක්ෂණය වන හෙයින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අයත් බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය එළදායි සැලසුමකින් සහ නිසි ප්‍රමිතියකින් තොරව ඉදිකර ඇති බව නිරීක්ෂණය වන හෙයින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වම්න්ද උයනගේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

40. <u>මාර්ග සංවර්ධන අධිකාරියට අයත් තිස්ස කිරින්ද ප්‍රධාන මාර්ගයේ බොහෝ ස්ථාන කඩතොළු වී ඇති බැවින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය සිදු කිරීම සඳහා වූ යෝජනාව</u>

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් තිස්ස කිරින්ද ප්‍රධාන මාර්ගයේ බොහෝ ස්ථාන කඩතොළු වී ඇති බැවින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය සිදු කර දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- <u>වෙනත් යෝජනා</u>

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

41. <u>කාපට් ඇතිරූ මංමාවත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් කාපට් ඇතිරූ මාර්ග නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට හැකියාවක් සහ පහසුකම් නොමැති බැවින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | දුර (km) |
|---|---|---|---|
| 01 | විහාරමහාදේවිපුර | විලමුල්ල - පුස්තෝලමුල්ල ජයවික්‍රම මාවත | 2.5 |
| 02 | ජුල්පල්ලම | රන්මිණිතැන්න ප්‍රධාන මාර්ගය කතරගම ප්‍රධාන මාර්ගයේ සිට සිතුල්පව්ව මාර්ගය දක්වා | 10 |
| 03 | මහසෙන්පුර | සඳගිරිගම ප්‍රධාන මාර්ගයේ සිට වැලිආරගොඩ කොන්ක්‍රීට් මාර්ගය දක්වා පාර | 01 |
| 04 | සඳගිරිපුර | තොරණ හන්දියේ සිට කතරගම ප්‍රධන මාර්ගය දක්වා මාර්ගය | 01 |
| 05 | වීරහෙළ | කතරගම ප්‍රධාන මාර්ගයේ සිට බෙරලිහෙළ කුඩා ගම්මාන 03 දක්වා | 05 |
| 06 | මාගම | මාගම හන්දියේ සිට කිරින්ද දක්වා මෝදර පැලැස්ස හරහා ඇති මාර්ගය | 06 |
| 07 | කිරින්ද | තිස්ස කිරින්ද ප්‍රධන මාර්ගයේ සිට කිරින්ද අන්දරගස්යාය ප්‍රධාන මාර්ගය දක්වා (රෝහල් පිවිසුම් මාර්ගය හන්දිය දක්වා) | 1.5 |
| 08 | රබර්වත්ත | රබර්වත්ත ගගේයාය මාර්ගය | 05 |
| 09 | අන්දරගස්යාය | ගොඩාන හන්දියේ සිට ගෙවල් 100 සුළු ධීවර ගොඩනැගිල්ල අසල දක්වා මාර්ගය | 1.5 |
| 10 | යෝධකණ්ඩිය | තිස්ස කිරින්ද ප්‍රධාන මාර්ගයේ වම් රණකෙළිය හරහා ඇති පාර (short cut පාර) | 2.5 |
| 11 | තිස්සපුර | නිවහන බුලේ අසල සිට සිරිනුවන් මහතාගේ නිවස අසල දක්වා මාර්ගය | 01 |
| 12 | සාලියපුර | වරාපිටිය වැව උඩ පාර ඇලකණ්ඩිය දක්වා පාර | 01 |
| 13 | ගෝණගමුව | ගංගාරාම හන්දියේ සිට 5 ගේට්ටුව දක්වා | 01 |
| 14 | විජයපුර | පාසල අසල සිට උනාව වැව අවසානය දක්වා | 01 |
| 15 | විජිතපුර | දෙබරවැව -ඇල්ලගල (වම් ඉවුර) පාර නව ඉදිකිරීම | 03 |
| 16 | සඳුන්ගම | තිස්ස- බෙරලිහෙළ ප්‍රධාන මාර්ගය සඳුන්ගම හරහා අකුරුගොඩ හන්දිය සිට මැණික් පාලම දක්වා | 03 |

| | | | |
|---|---|---|---|
| 17 | සඳුන්ගම | ටිකිරි මාවත සිට කරුණා මාවත හරහා මුතියම්මාගම පාසල අසලට | 02 |
| 18 | එකමුතුගම | අඩි 100 පාර | 01 |
| 19 | අංජලිගල | දෙබරහැර පාසල අසල සිට වැල්ලවාය පාරට යන මාර්ගය | 02 |
| 20 | දඹෙවැලැන | සුසානභූමිය අසල සිට ඇල්ලගල දක්වා මාර්ගය | 04 |
| 21 | ගැමුණුපුර | දෙබරවැව සිට විජිතපුර බෝධි එක දක්වා | 1.8 |
| 22 | ගැමුණුපුර | දෙබරවැව ජලටැංකිය ළඟ සිට ගඟ පාර විජිතපුර වසම දක්වා | 1.6 |
| 23 | පොල්ගහවැලැන | ගඟ පාර පාලම අසල සිට රන්දුණුවත්ත මායිම දක්වා | 02 |
| 24 | මහින්දපුර | පන්වල හන්දිය සිට බොරළු පාර දක්වා | 2.5 |
| 25 | ඇල්ලගල | දෙවන පෙළ මාර්ගය | 02 |
| 26 | ශුද්ධ නගරය | සේනානායක පාර | 0.8 |
| 27 | කිරින්ද | කිරින්ද රෝහල ඉදිරිපස අන්දරගස්යාය පාර සිට අතුරු මාර්ගය | 0.5 |

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

➢ <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

42. <u>ZB - 0413 කම්පැක්ටර් රථය අලුත්වැඩියා කිරීම සහ අදාල බිල්පත් පියවීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ඉහත අංක දරණ කම්පැක්ටර් රථයෙහි එන්ජිම අලුත්වැඩියා කිරීම සඳහා දකුණු පළාත් පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ උපදෙස් පරිදි රථය ගාල්ල ප්‍ර දේශයේ AUTO BASE ආයතනය වෙත යොමු කළ අතර එම සම්පූර්ණ අලුත්වැඩියාව සිදු කිරීම සඳහා එම ආයතනය විසින් ඉදිරිපත්කර ඇති රු. 1,627,637.75 වන ඇස්තමේන්තුව සඳහා දකුණු පළාත් පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ අනුමැතිය හා හිමි වූ අතර ඒ අනුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීමටත්, අදාල බිල්පත් පියවීමටත් වන යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරමි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථාන වලින් මිල කැඳවීම කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා</u>

ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව අදාළ කටයුතු සිදු කර ඇති බැවින් අක්‍රමිකතාවක් සිදු නොවන බව ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

43. <u>මහ ට්‍රැක්ටර ට්‍රේලර් 03 අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ධාවනයෙන් ඉවත් කරන ලද මහ ට්‍රැක්ටර් ට්‍රේලර් 03 ක් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පරිපාලකතුමා විසින් සිදුකරන ලද ඉල්ලීමට ගරු සභාපතිතුමාගේ අනුමැතිය හිමිව ඇති අතර, අදාළ ට්‍රේලර් 03 අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රාදේශීය මාර්ග යාන්ත්‍රික ඉංජිනේරු එම්.මහේෂ් උදයංග මහතා වෙත යොමු කළ අතර එතුමාගේ නිර්දේශ අනුව ඇස්තමේන්තු ලබාගෙන අදාළ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා විෂය නිලධාරි විසින් කරන ලද යෝජනාවට 2025.06.19 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ හිමි විය. ඒ අනුව තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කර ඇති රු. 756,530.00 (එක් ට්‍රේලරයක් සඳහා) වන ඇස්තමේන්තුව අනුව ඉදිරි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදීගැනීම වෙනුවෙන් සුරංග හාඩ්වෙයාර් වෙත ගෙවීමට වන රු.518,300.00 බිල්පත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

44. <u>තිස්සමහාරාම පුජා නගර රථ වාහන නැවතුම්පොළ බදු අයිතිය ලබා දීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම පූජා නගර රථ වාහන නැවතුම්පොළ 2025 වර්ෂය සඳහා මහ හැන්නැදිගේ චන්ද්‍රලතා යන අය විසින් බදු අයිතිය ලබා ගෙන ඇති අතර 2025 මැයි, ජුනි, ජුලි යන මාසයන් අදාලව (මාසික වාරික මුදල රු. 52100.00 බැගින් රු.156300.00) ක මුදලක් ගෙවීම් සිදු නොකර පැහැර හැර ඇත.ටෙන්ඩර් නීති උල්ලංඝනය වන ආකාරයෙන් ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් ඉහත දේපලෙහි බදු අයිතිය අහෝසි කර එහි දෙවන අයදුම්කරු වෙත ටෙන්ඩරය පිරිනැමීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

45. <u>තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළේ වැසිකිළි පද්ධතිය සකස්කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දීම සඳහා වූ යෝජනාව</u>

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනට අනුව සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළේ වැසිකිළි පද්ධතිය සකස්කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම.

2025.06.19 හා 2025.07.04 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව, 2025.06.19 හා 2025.07.04 දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභා වාර්තාව,

2025.06.18 හා 2025.07.03 දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සහ 2025.06.18 හා 2025.07.03 දින පවත්වන ලද පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාවන් ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා,වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

I. 2025 ජූනි මස ඒකාබද්ධ ලැබීම් හා ඒකාබද්ධ වියදම් සාරාංශය

2025 ජූනි මාසය සඳහා මාසික ඒකාබද්ධ ලැබීම් රු.7,597,885.83 ද, ජූනි මාසය සඳහා මාසික ඒකාබද්ධ වියදම රු.12,184,178.81 ද වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

II. 2025 ජූනි මස හිඟ ආදායම් වාර්තාව

2025 ජූනි මාසය අදාළ, ආදායම් අය කර ගැනීම සහ හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය අනුව සමස්ත හිඟ මුදල රු.11,317,943.72 වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

III. 2025 ජූනි 02 දින සිට ජූනි 30 දක්වා රු.100,000.00 ඉක්ම වූ ගෙවීම් විස්තරය ඇතුළත් වාර්තාව

| අනු අංකය | වවුචර දිනය | වවුචර අංකය | වවුචර විස්තරය | ගෙවන ආයතනය | මුදල රු. |
|---|---|---|---|---|---|
| 01 | 2025.06.02 | 01 | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා 37.5 kg සිලින්ඩර් 08 ක් මිලට ගැනීම වෙනුවෙන් වෙනුවෙන් බිල්පත් පියවීම. | සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම | 142,478.97 |
| 02 | 2025.06.06 | 41 | 2025 මැයි මස දෛනික කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම | ලේකම්, නි.ප්‍රා සභාව | 247,576.24 |
| 03 | 2025.06.09 | 48 | 2025 මැයි මස කාර්ය මණ්ඩල අතිකාල දීමනා ගෙවීම | ලේකම්, නි.ප්‍රා සභාව | 582,932.00 |
| 04 | 2025.06.16 | 57 | විදේශ සංචාර පුහුණු (පෙර පාසල් ගුරු) කටයුතු සඳහා ගමන් වියදම් ප්‍රතිපූර්ණය කිරීම.(එක් පෙර පාසල් ගුරුවරියක් සඳහා 67,713.75 ක් වශයෙන් පලාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපූර්ණය වී ඇත. | එම්.ප්‍රබෝධා ශිරෝමනි මිය<br><br>එස්.එල්.නිරෝෂා නිරංජනී පුදුසිංහ මිය<br><br>එච්.කේ.වී.සමුදිකා ද සිල්වා මිය | 203,141.25 |
| 05 | 2025.06.19 | 58 | ප්‍රාදේශීය සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිලට ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම | ඉරේෂා ෆිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 1,166,377.00 |
| 06 | 2025.06.20 | 73 | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා මිලට ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම | 124,665.98 |
| 07 | 2025.06.23 | 92 | 2025 ජූනි මස ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම | අදාළ බැංකු හා අවකරණ ආයතන | 6,021,430.50 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | වෙත | |
| 08 | 2025.06.24 | 94 | ප්‍රාදේශීය සභාව සතු අනෙකුත් උප ආයතන සඳහා ජල බිල්පත් පියවීම | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 101,199.65 |
| 09 | 2025.06.30 | 100 | ප්‍රාදේශීය සභාව සතු රථවාහන හා යන්ත්‍රසූත්‍ර සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | ඉරේෂා ෆිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 506,017.00 |
| 10 | | 101 | සූරියවැව ප්‍රාදේශීය සභාවේ ගලි බවුසර සේවාව ලබා ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම | ලේකම්,සූරියවැව ප්‍රා.සභාව | 100,000.00 |

2025 ජුනි 02 දින සිට ජුනි 30 දක්වා රු.100,000.00 ඉක්ම වූ, ඉහතින් දක්වා ඇති ගෙවීම් විස්තරය ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

IV. <u>2025 ජුනි 01 සිට 2025.06.30 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් වාර්තාව</u>

| අනු අංකය | ලියාපදිංචි අංකය | නාම හා ලිපිනය | අනුමැතිය | කමිටු දිනය |
|---|---|---|---|---|
| 01 | TPS/19/SD/2025/51 | එච්.කේ.දිනේෂ්සංජීව, අමුණුකරයාය ,මාගම, තිස්සමහාරාම | අනු බෙදුම් අනුමත විය. | 2025.06.20 |
| 02 | TPS/19/SD/2025/69 | එච්.කේ.දිනේෂ්සංජීව, අමුණුකරයාය ,මාගම, තිස්සමහාරාම | අනු බෙදුම් අනුමත විය. | 2025.06.20 |
| 03 | TPS/19/SD/2025/91 | ජේ.ජී.සරත්,අංක 265/1, හැළඹගස්වල, තිස්සමහාරාම. | අනු බෙදුම් අනුමත විය. | 2025.06.20 |
| 04 | TPS/19/SD/2025/92 | එච්.ආර්.ජයන්ත,නො.17/A,සිරිපද වත්ත, හැළඹගස්වල, තිස්සමහාරාම. | අනු බෙදුම් අනුමත විය. | 2025.06.20 |
| 05 | TPS/19/SD/2025/94 | චමිලා දමයන්ති විජේසිංහ, ආතර්පෙදෙස, ඩී.ඩී.ගුණවර්ධන මාවත,දෙබරවැව, තිස්සමහාරාම. | අනු බෙදුම් අනුමත විය. | 2025.06.20 |
| 06 | TPS/19/BA/2025/28 | ඩී.අයි.කඩහෙට්ටි, පුහුවැලිපැලැස්ස, ද්‍රණකෙලිය, විහාරමහාදේවිපුර,තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.06.20 |
| 07 | TPS/19/BA/2025/45 | චමිලා දමයන්ති විජේසිංහ, ආතර්පෙදෙස, ඩී.ඩී.ගුණවර්ධන මාවත,දෙබරවැව, තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.06.20 |
| 08 | TPS/19/BA/2025/46 | එන්.ජී.දසුන් මදුරංග, මහසෙන්පුර, තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.06.20 |
| 09 | TPS/19/BA/2025/31 | එච්.කේ.දිනේෂ්සංජීව, අමුණුකරයාය , මාගම, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.06.20 |
| 10 | ත්‍රිපාස/19/සං/අ/2024/98 TPS/19/COC/2025/18 | ජේ.එන්.නුවංගි, අංක 435,මහවත්ත,වලගම්පත්තුව,තිස්සමහාරාම. | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය. | 2025.06.20 |
| 11 | ත්‍රිපාස/19/සං/අ/2024/62 TPS/19/COC/2025/19 | ජී.ජී.අකිල තිසර මධු හැරල්ඩ්, පොල්ගහවැලාන, දෙබරවැව,තිස්සමහාරාම. | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය. | 2025.06.20 |
| 12 | ත්‍රිපාස/19/සං/අ/2024/41 | එස්.පී.පත්මසිරි, අංක 314,ජී.ඊ.ජී.සිල්වා මාවත,යායගොඩ ,තිස්සමහාරාම | සංවර්ධන බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීම අනුමත විය. | 2025.06.20 |

2025 ජුනි 01 සිට 2025.06.30 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් ඉහතින් දක්වා ඇති වාර්තාව ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

(ඌ) වෙනත් කරුණු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වන ආර්.කේ.එම්.රෝහිත මහතා, එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා, ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණි මහත්මිය, එල්.ඒ.සුනිල් පියංකර මහතා, ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය, එස්.දයාසේන මහතා, සුදත් චමින්ද උයනහේවා මහතා, බී.කේ.නිලූකා කුමුදුනී මහත්මිය, ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා, එම්.ඒ.ආරියසේන මහතා සහ ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් අදහස් දැක්වීම සිදු කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්මියටත්, මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි මහතාටත් , රුක්මන් රත්නායක මහතාටත් ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව.02.00 ට පමණ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ලේකම්,
ආර්.එම්.චතුරානි වැලිවිහාරේ,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

එච්. එල්. ජයසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම.

එච්.එල්.ජයසිරි,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2025 ජූලි මස 22 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

<u>2025.08.21 වන දින පවත්වන ලද මහ සභාවේ සංශෝධනයන් දැක්වීම.</u>

(අ) 2025.07.22 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

2025.07.22 වන දින පවත්වන ලද මහ සභා වාර්තාවේ යෝජනා අංක 02 ට අදාළව අදහස් දැක්වීම යටතේ "තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LL-7379 ගලි බවුසර රථයට අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ දී, මිල ගණන් කැඳවීම නිසි ආකාරයෙන් සිදු කිරීමෙන් අනතුරුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට " ලෙස සංශෝධනය කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් දන්වා සිටින ලදී.

එච්. එල්. ජයසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම.

එච්.එල්.ජයසිරි,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.